# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2188/32 - 2020 අගෝස්තු මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2020.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 3/1/81/2014.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/2/2014/A/194.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ විසිදෙකේ නැගෙනහිර කෝරළයේ, අංක 553 ලිහිණිවැහැර ග්‍රාම නිලධාරි වසමේ, ලිහිණිවැහැර ගමේ පිහිටි කුරුණෑගල මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 420151 කලාප අංක 03, පත්‍ර අංක 03 න් පෙන්නුම් කරන කට්ටි අංක 514 හා 515 යන බිම් කැබලි දෙක:

01. **කැබලි අංකය 514**
ඉඩමේ නම: හොලොන්ගොල්ල වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: කුරුණෑගල වැවිලි සමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 1.5046.

*මායිම් විස්තරය :*
*උතුරට*: 515, 82 සහ 83 වැනි බිම් කැබැලි; *නැගෙනහිරට*: 83 වැනි බිම් කැබැල්ල; *දකුණට*: 94, 92 සහ 88 වැනි බිම් කැබැලි; *බටහිරට*: 88, 86 සහ 515 වැනි බිම් කැබැලි;

02. **කැබලි අංකය 515**
ඉඩමේ නම: හොලොන්ගොල්ල වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1192.

*මායිම් විස්තරය :*
*උතුරට*: කුඩා ඔය; *නැගෙනහිරට*: 82, 83 සහ 514 වැනි බිම් කැබැලි; *දකුණට*: 514 සහ 88 වැනි බිම් කැබැලි; *බටහිරට*: 86 වැනි බිම් කැබැල්ල සහ කුඩා ඔය.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020.09.10 වැනි දින පෙ.ව. 9.30 ට රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.09.03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
රිදීගම.

2020 ජූලි මස 30 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-595


1A - G 32668 - 37 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.